# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 904 /2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 29/05/2024<br>පැය 1345 |

# මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් 07 ක් සහ තවත් සැකකරුවන් 07 දෙනෙකු අත්අඩංගුවට - කළුතර, ගාල්ල, මාතර, කොළඹ, බස්නාහිර පළාත් දකුණ හා බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාස.**

2024.03.19 වන දින සිට බස්නාහිර පළාත හා දකුණු පළාත මූලික කර ගෙන ක්‍රියාත්මක සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් අත්අඩංගුවට ගැනීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි විශේෂ පොලිස් කණ්ඩායම් 20 ක් යොදවා මෙහෙයුම් ආරම්භ කරන ලදී. මෙම මෙහෙයුමට සම්බන්ධ කළුතර අපරාධ කොට්ඨාසය, ගාල්ල අපරාධ කොට්ඨාසය, කොළඹ අපරාධ කොට්ඨාසය හා මාතර අපරාධ කොට්ඨාසය විශේෂ පොලිස් කණ්ඩායම් විසින් පහත වැටලීම් සිදු කර ඇත.

1. 2024.05.28 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් බොරැල්ල පොලිස් වසමේ වැටලීමක් සිදුකර හෙරොයින් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 390ක් සමඟ සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 50 ක් වන කොළඹ 08 ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

2. 2024.05.28 වන දින කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මාලිගාවත්ත පොලිස් වසමේ වැටලීමක් සිදුකර හෙරොයින් මත්ද්‍රව්‍ය මිලි ග්‍රෑම් 590 ක් සමඟ සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

3. 2024.05.28 වන දින මාතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් දික්වැල්ල පොලිස් වසමේ වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන දික්වැල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

4. 2024.05.28 වන දින මාතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මාතර පොලිස් වසමේ වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 57 ක් වන දෙව්නුවර ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

5. 2024.05.28 වන දින ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ඌරගස්මංහංදිය පොලිස් වසමේ වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන ඌරගස්මංහංදිය ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

6. 2024.05.28 වන දින ගාල්ල අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් මීටියාගොඩ පොලිස් වසමේ වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වන මීටියාගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

7. 2024.05.28 වන දින කළුතර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් බණ්ඩාරගම පොලිස් වසමේ වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කල්ලි කණ්ඩායමකට සම්බන්ධ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත.

   **අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන ගැලනිගම ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

ඉහත අත්අඩංගුවට ගන්නා ලද අපරාධ කල්ලි සාමාජිකයින් 07 දෙනාට අමතරව ඔවුන් සමඟ විවිධ සම්බන්ධතා පවත්වමින් අපරාධවලට සහය දැක්වූ බවට සැක කරන තවත් සැකකරුවන් 07 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. **ඒ අනුව 2024.05.28 වන දින සැකකරුවන් 14 ක් අත්අඩංගුවට ගෙන ඇත.**

**මෙම මෙහෙයුම් ආරම්භ කරන ලද 2024.03.19 වන දින සිට 2024.05.28 වන දින දක්වා සමස්ත සැකකරුවන් හා සැකකාරියන් 1211 ක් අත්අඩංගුවට** ගෙන ඇති අතර, සංවිධානාත්මක අපරාධ සිදු කිරීම සඳහා සෘජුවම සහය දැක්වීම, අපරාධ සැලසුම් කිරීම හා එම අපරාධ වලට ආධාර අනුබල දීම ආදී විවිධාකාරයෙන් සහය ලබා දුන් සැකකරුවන් හා සැකකාරියන් මේ අතර වේ.

අත්අඩංගුවට ගත් සැකකරුවන් සම්බන්ධව කොළඹ අපරාධ කොට්ඨාසය, මාතර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය, බස්නාහිර පළාත් දකුණ අපරාධ කොට්ඨාසය මඟින් රැඳවුම් නියෝග ලබා ගෙන වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**